655

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2007

**කම්කරු නීතිය – LWU 3323 / 4314 / 4323**

කාලය - පැය තුනයි

---

දිනය 2007 මාර්තු මස 15 වන දින          වේලාව  ප ව 1.30  ප ව 4.30 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. සේවා නියුක්ති ගිවිසුමෙහි ස්වභාවය වෙනස් කිරීම සඳහා දායක වූ වැදගත් වර්ධනයන් විවේචනාත්මකව පැහැදිලි කරන්න.

2. (අ) "සේවා නියුක්ති වර්ග සම්බන්ධයෙන් සේවා යෝජකයන් විසින් භාවිත කරනු ලබන තනතුරු නිල නාමයන් අවසානාත්මක හා තීරණාත්මක නොවේ. අධිකරණ විසින් කරුණු සලකා බලා සේවකයන් අයත් වන්නේ කුමන සේවා නියුක්ති වර්ගයට දැ යි තීරණය කරනු ඇත."

   විනිශ්චිත නඩු තීරණ ඉදිරිපත් කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

   (ආ) ඉදි කිරීම් සමාගමක් වූ සීමාසහිත සුරේකා ඉදි කිරීම් සමාගම විසින් කළුතර සුපිරි වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම සඳහා සේවකයන් 150 දෙනෙකු පමණ සේවයට බඳවා ගන්නා ලදී. ඔවුන් වසර 3 ක කාලයක් සඳහා සේවයට බඳවා ගන්නා ලදී. ඔවුන්ගේ සේවා නියුක්තියේ කාල සීමාව සමාගම විසින් දීර්ඝ නොකරනු ලැබුවහොත් මිස ඔවුන්ගේ සේවා නියුක්ති ගිවිසුම වසර 3 කාලයක් සඳහා බව ඔවුන්ගේ පත්වීම් ලිපිවල පැහැදිලිව සඳහන් වේ. ඉදි කිරීම් වැඩ නිම කිරීම සඳහා සමාගම සේවකයන් 50 දෙනෙකුගේ සේවය තවත් මාස 6 ක කාලයක් සඳහා දීර්ඝ කළේය. සිය සේවය නතර කිරීම සම්බන්ධයෙන් කිසියම් සහනයක් සඳහා තමනට හිමිකම් ඇත් දැ යි දැනගැනීමට සේවය දීර්ඝ නොකරන ලද සේවකයෝ අදහස් කරති.

   ඔවුනට උපදෙස් දෙන්න.

3. (i) කම්කරු ආරවුල් නිරාකරණය කිරීම සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා හා කම්කරු ඇමතිවරයා වෙත පවරා ඇති බලතල විවේචනාත්මකව පැහැදිලි කරන්න.

   (ii) සීමාසහිත රාජිත ආරක්ෂක පෞද්ගලික සමාගම විසින් 2001 සිට රාහුල ආරක්ෂක නිලධාරියකු වශයෙන් සේවයේ යොදවනු ලැබීය. රාහුල විසින් පහත සඳහන් විෂමාචාරයන්

සිදු කර තිබූ හෙයින් ඔහුගේ සේවය 2007 පෙබරවාරි මස 26 වන දින සිට අවසන් කරන ලදී.

(1) සමාගමට අයත් කාඩ්බෝඩ් පෙට්ටි හතක් ගෙන යාමට රාහුල විසින් කම්කරුවකුට අවසර දීම
(2) කාඩ්බෝඩ් පෙට්ටි පිළිබඳව ගේට්ටුව අසල දී කම්කරුවාගෙන් ප්‍රශ්න කිරීම සම්බන්ධයෙන් රාහුල සහකාර ආරක්ෂක නිළධාරියෙකුට බැණ වැදීම

සිය සේවය නතර කිරීමට එරෙහිව සහන ඉල්ලා සිටීමට රාහුල අදහස් කරයි.

රාහුලට උපදෙස් දෙන්න.

4. "කම්කරු විනිශ්චය සභාවක, බේරුම්කරුවකුගේ සහ කාර්මික අධිකරණයක ප්‍රධානතම යුතුකම වන්නේ යුක්ති සහගත හා සාධාරණ නියෝගයක් හෝ ප්‍රදානයක් ලබා දීමයි. යුක්ති සහගත හා සාධාරණ යන වදන පිළිබඳව නියත අර්ථ විග්‍රහයක් නොමැති හෙයින් යුක්ති සහගත හා සාධාරණ තීරණ දීම සම්බන්ධයෙන් ඉහල අධිකරණ විසින් මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත."

විනිශ්චිත නඩු තීරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

5. වීදුරු භාණ්ඩ නිපදවීම සඳහා සීමාසහිත 'ක්ලියර් ග්ලාස්' සමාගම විසින් සේවකයන් සිය දෙනෙකුට අධික ප්‍රමාණයක් සේවයේ යොදවනු ලබයි. කළමණාකරණය විසින් තමනට අසාධාරණ ලෙස සලකන බවත් තම සේවා නියුක්තියට අදාල වන කම්කරු නීති ඔවුන් විසින් උල්ලංඝනය කරනු ලබන බවත් සේවකයෝ චෝදනා කරති. සිය දුක්ගැනවිලි කළමණාකරණය සමග සාකච්ඡා කිරීම සඳහා සේවකයන් විසින් ගනු ලැබූ ප්‍රයත්නයන් අසාර්ථක වී ඇත. සිය අයිතිවාසිකම් රැක ගැනීම සඳහා වෘත්තීය සමිතියක් පිහිටුවා ගැනීමට සේවකයෝ අදහස් කරති. පහත සඳහන් කරුණු පිළිබඳව ඔවුන්ගේ නියෝජිතයෝ ඔබේ උපදෙස් පතති.

(i) වෘත්තීය සමිතියක් පිහිටුවා ගැනීමේ අයිතිය
(ii) ලියාපදිංචි වෘත්තීය සමිතියකට හිමි අයිතිවාසිකම්, විනිර්මුක්තීන් හා වරප්‍රසාද

ඔවුනට උපදෙස් දෙන්න.

6. සංශෝධිත 1971 අංක 45 දරණ සේවකයන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පණතේ වැදගත් ලක්ෂණ පණතේ අදාල විධිවිධාන හා විනිශ්චිත නඩු තීරණ කෙරෙහි අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

7. (අ) ශ්‍රී ලංකාවේ කාන්තාවන් සේවයේ යෙදවීමේ නියම හා කොන්දේසිවලට අදාළ කම්කරු නීතිවල විධිවිධාන පැහැදිලි කරන්න.

(ආ) පුවත්පත් නියෝජිතයෙකු වූ ලක්සිරි සිය පාරිභෝගිකයන් අතර පුවත්පත් බෙදා හැරීම සඳහා අවුරුදු 12 සිට 15 දක්වා වූ වයස් කාණ්ඩවලට අයත් පිරිමි ළමුන් කණ්ඩායමක් සේවයේ යොදවයි. ඔවුහු පාසලට යාමට පෙර උදේ පැයක් පමණ කාලයක් තිස්සේ පුවත් පත් බෙදා හරිති. ළමුන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ලක්සිරිට එරෙහිව නෛතික පියවර ගැනීමට සමාජ සේවකයෙකු වූ සිල්වා අදහස් කරයි.

සිල්වාට උපදෙස් දෙන්න.

8. පහත සඳහන් දෑ පිළිබඳ සටහන් ලියන්න.

(i) සාමූහික ගිවිසුම් පිළිබඳ නෛතික අංශය
(ii) සංශෝධිත 1983 අංක 12 දරණ පාරිතෝෂිකය ගෙවීමේ පණත

හිමිකම් ඇව්රිණි
*************